


15

## කටු

ජගත් ජේ එදිරිසිංහ

හසන්ත රිසිවරය කන තබා ගත්තේය.

"විදුල ... මම හසන්ත ඇලදෙණිය..." හසන්ත කාලය වැය නොකර තමා හඳුන්වා දුන්නේය. " .. සමහර විට නිරාශා ඔයාට මා ගැන කියලත් ඇති... මට ඔයා හමුවෙන්න ඕනෙ.."

ඔහුට තමා හමුවන්නට අවශ්‍යව ඇත්තේ මන්දැයි විදුල දනියි. එනමුදු ඔහුට දිය යුතු පිළිතුර සිතා ගන්නට විදුල තත්පර කීපයක් වැය කළේය. හසන්ත හමුවීමේ වරදක් තිබිය නොහැකි යයි ඒ අතරේ ඔහුට සිතුණි.

"හමුවෙමු.. " කල්පනාවෙන් අනතුරුව විදුල කීවේය.

"කොහෙදිද.. කීයටද..?"

"හෙට හවස හතරට මට දේශනයක් කරන්න තියෙනවා යූත් ෆිල්ම් ෆෝරම් එකේ.. ඒකෙන් පස්සෙ මම නිදහස්.. "

හෙට සවස හතරට අධ්‍යක්ෂ මණ්ඩලයේ සාකච්ඡාවක් ඇති බව හසන්තගේ මේසය ඉදිරියේ බිත්තියේ සවි කර ඇති විසල් දින දසුන පෙන්වා දෙයි. අලුතින් හඳුන්වාදීමට අදහස් කරගෙන සිටින නව නිෂ්පාදනයක් පිළිබඳව වූ ඒ සාකච්ඡාව සැළසුම් කරන ලද්දේ මාසයකට පමණ පෙරදීය. එනමුදු විදුල හමුවීම සඳහා එය කල් දමන්නට හසන්ත දෙවරක් නොසිතයි.

"හොඳයි.. මම එහෙනම් ලෙක්චර් එක ඉවර වුණාම විදුලව ගන්නං.. අපට පුළුවන් කොහෙ හරි ගිහින් කතා කරන්න.."

000000000000000

"අද්‍යතන සිනමාවේ ගමන් මග හා සමාජය" මැයෙන් වූ සිය දේශනය හමාර කරන මොහොතේ විදුල සිටියේ දැඩි තෘප්තියකිනි. තමාට අවශ්‍ය වූ ආකාරයෙන්ම කරුණු ඉදිරිපත් කරන්නටත් සුමට ලෙස ගලා යන ශෛලියකින් දේශනය ඉදිරිපත් කරන්නටත් තමාට හැකි වූ බවට වූ විශ්වාසයක් ඔහුගේ සිත තුළ විය. ශාලාවේ ඈත කෙළවරකට වී තම දේශනයට ඇහුම්කන් දෙමින් සිටි මදාරාගේ මුහුණෝ වූයේ ද ඔහුගේ නිගමනය තහවුරු කරන බැල්මක් බව විදුල දුටුවේය.

කලාත්මක වාණිජ වර්ග කිරීමකින් තොරව මෑත යුගයේ ප්‍රදර්ශනය කෙරුණ චිත්‍රපට රැසකින් ආදර්ශ ඉදිරිපත් කරමින් ඔහු කළ දේශනය බොහෝ දෙනෙකුගේ සිත් ගත් බවක් ද පෙනුණි.

සියල්ල ගාලගෝට්ටියක් බවට පත්වූයේ දේශනයෙන් පසුව ඇරඹුණ සාකච්ඡා සභාවේදීය. සභාවේ කීප තැනකින්ම පිට පිට ඇසුණ ප්‍රශ්න වැල කිසි ලෙසකින්වත් විදුලගේ දේශනයට දාල ඒවා නොවීය. ඒවා විදුල කෙරහි එල්ල වූ චෝදනා සහ අවලාද වීම ප්‍රදර්ශනය කළේ ඒ සියල්ල කලින් සැළසුම් කළ ඒවා වූ බවය. සභාවේ බහුතරයක් නිහඬව සිටියදී විදුල මෙයට පෙර කිසිදු තැනකදී නොදැක සිටි නාඳුනන පුද්ලයෝ කීප දෙනෙක් එකාවන්ව වියරුවෙන් මෙන් කෑ ගසමින් විදුලට වාග් ප්‍රහාර එල්ල කළහ.

ජනතා අරගලය පාවාදීමක් ගැනත් කොටි ත්‍රස්තවාදයට උදව් දීමක් ගැනත් සමාජයේ කීර්තිමත් පුද්ගලයනට අපහාස කරමින් සිනමා නිර්මාණ බිහි කිරීමක් ගැනත් රාජ්‍ය නොවන සංවිධාන වලින් මුදල් ලබා ගැනීමක් ගැනත් එකිනෙකට එකක් නොගැළපෙන නොපෑහෙන චෝදනා වැලක් එල්ල වූයේ විදුල තුෂ්නිම්භූතව බලා සිටියදීය. මේ චෝදනා අතරින් වඩාත් අවධාරණය කෙරුණේ කීර්තිමත් පුද්ගලයන්ට අපහාස කිරීම සඳහා සිනමාපට නිපදවන්නේය යන චෝදනාවයි.

ඒ අතරේ කොතැනක සිට හෝ විසි කෙරුණ බිත්තර කීපයක්ද වේදිකාවේ විදුල සිටි පෙදෙසට වැටී පොඩි වී ගියේය. ප්ලාස්ටික් පුටු කීපයක් පොළොවේ ගසා කඩා දැමුවේ මැරවරයකුගේ පෙණුම තිබූ හැඩි දැඩි පුද්ගලයෙකි.

මුලසුණේ සිටි අරුණ විජේදාස සභාව කිසියම් ලෙසකින් හසුරුවා ගන්නට වෑයම් කරමින් සිටියද ඔහුගේ කටහඬ පවා කිසිවකුට නෑසුනි. ඒ ගාල ගෝට්ටිය අතරේ සභාවේ ඈත කෙළවරේ සන්සුන් ලෙස වාඩි වී විදුල දෙසම නෙත් යොමා සිටි පුද්ගලයකු විය. උපහාසාත්මක සිනාවකින් මුව සරසාගත් ඒ පුද්ගලයා කථිකාචාර්ය තිසර සූරියබණ්ඩාර බව විදුල හඳුනාගත්තේය. මේ සියල්ලේ සංවිධායකයා ඔහු විය යුතු යයි විදුලට සිතුණි. යමක් කළ යුතු යයි සිතුණ නමුත් ඒ වෙනුවෙන් කාලයක් ඔහුට නොවීය.